# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 25 දරන

# ධන බදු අධිභාර පනත

---

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 අගෝස්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 14/82.

**1981 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ධන බද්ද ගෙවීමට යටත්වන සෑම තැනැත්තකුගෙන් ම ඒ තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු වූ ධන බද්දට අදාළව අධිභාරයක් නියම කිරීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ධන බද්ද විෂයෙහි අධිභාරයක් නියම කිරීම.

**2.** 1981 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ධන බද්ද ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු ම, යම් ලිඛිත නීතියක හෝ යම් සම්මුතියක, ප්‍රදානයක නැතහොත් ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවනු ලැබිය යුතු ධන බද්දෙන් සියයට දහයකට සමාන අධිභාරයක් ගෙවීමට යටත් විය යුතු ය.

අධිභාරය ගෙවීම සඳහා වූ දිනය.

**3.** 2 වන වගන්තිය යටතේ අධිභාරයක් ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු ම, ඔහුට තක්සේරුවක් නිකුත් කර නොතිබීම කෙසේ වුව ද, ඔහු විසින් ගෙවනු ලැබිය යුතු අධිභාරයේ මුදලින් සියයට පණහකට නොඅඩු ප්‍රමාණයක් 1982 ජූලි මස 15 වන දින හෝ ඊට පෙර සහ ශේෂය 1982 නොවැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය.

දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

**4.** වාර වාර්තා සැපයීමට, තක්සේරු කිරීමට, තක්සේරුවට විරුද්ධව අභියාචනා කිරීමට, ධන බද්ද ගෙවීමට, අයකර ගැනීමට සහ ආපසු ගෙවීමට අදාළ දේශීය ආදායම් පනතේ XIII වන පරිච්ඡේදයේ සහ XVII සිට XXVI දක්වා වූ පරිච්ඡේදවල විධිවිධාන, 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු වූ අධිභාරය පිළිබඳව වාර වාර්තා සැපයීම, තක්සේරු කිරීම, තක්සේරුවට විරුද්ධව අභියාචනා කිරීම, ගෙවීම, අයකර ගැනීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

**5.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙහි, දේශීය ආදායම් පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"දේශීය ආදායම් පනත" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ ;

"ධන බද්ද" යන්නෙන්, දේශීය ආදායම් පනත යටතේ පනවා අයකරනු ලබන ධන බද්ද අදහස් වේ ;

"තක්සේරු වර්ෂය" යන්නෙහි, දේශීය ආදායම් පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.